## මුදල් විශුද්ධිකරණය,
## ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ
## සමූලඝාතක අවිසංගුණනයට මුදල් සැපයීම
## සම්බන්ධයෙන්

# ශ්‍රී ලංකාවේ
# ජාතික අවදානම් ඇගැයීම

## 2024/2025

## සාරාංශය




# අ. විශ්ලේෂණය

මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදයට මුදල් සැපයීම සහ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම සම්බන්ධයෙන් මෙරට පවතින අවදානම් හඳුනා ගැනීමට, අවදානම් මට්ටම් තක්සේරු කිරීමට සහ අවබෝධ කර ගැනීමට ශ්‍රී ලංකාවේ ජාතික අවදානම් ඇගැයීම ක්‍රියාත්මක කෙරේ. මෙම තක්සේරුව මගින්, තර්ජන සහ අවදානමට ලක් වීමට ඇති හැකියාව මත පදනම් ව මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් පිළිබඳ ව මෙරට සමස්ත අවබෝධය පෙන්නුම් කරයි. මූල්‍ය කාර්ය සාධක බලකායේ 1 වන නිර්දේශයට අනුකූල ව සිදු කරනු ලබන මෙම ජාතික අවදානම් ඇගැයීම මගින්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ උපායමාර්ග ක්‍රියාවට නැංවීම සහ හඳුනාගත් අවදානම් ඵලදායී ලෙස කළමනාකරණයට සහ අවම කිරීම සඳහා අවශ්‍ය සම්පත් කාර්යක්ෂම ව වෙන් කිරීම සඳහා අවදානම මත පදනම් වූ ප්‍රවේශයක් සපය යි.

මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාතික සම්බන්ධීකරණය කමිටුවේ ප්‍රතිපත්තිමය මග පෙන්වීම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් ජාතික අවදානම් ඇගැයීම සම්බන්ධීකරණය කරනු ලැබේ. ඒ සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකාර ආයතනවල විශේෂඥ නියෝජිතයින්ගෙන් සමන්විත බහු පාර්ශ්වීය ක්‍රියාකාරී කණ්ඩායම්වල සහභාගීත්වය ද හිමි වේ. මෙම ජාතික අවදානම් තක්සේරුව සඳහා ඉහළ ම මට්ටමේ දේශපාලනික සහයෝගයක් ද ලැබී ඇත.

2012 වසරේ දී මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ සංශෝධනය කිරීමෙන් අනතුරුව දී මෙරට පළමු ජාතික අවදානම් ඇගැයීම 2014 වසරේ දී සිදු කරන ලදී. 2015 වසරේ සිට 2022 වසර දක්වා වූ දත්ත ඇතුළත් කරමින් දෙවන ජාතික අවදානම් ඇගැයීම 2021/22 කාලයේ දී සිදු කළ අතර, කොවිඩ් - 19 ගෝලීය වසංගතය සහ ආර්ථික අස්ථායිතාව හේතුවෙන් මතු වූ බාධා මධ්‍යයේ වුව ද එය සාර්ථක ව නිම කිරීමට සමත් විය.

2023 වසරේ සිට 2025 වසර දක්වා වූ තොරතුරු ඇතුළත් 2024/25 ජාතික අවදානම් ඇගැයීම ශ්‍රී ලංකාවේ තෙවන ජාතික අවදානම් ඇගැයීම වන අතර සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම සම්බන්ධ මෙරට පළමු අවදානම් ඇගැයීම ද ඊට ඇතුළත් වේ. මෙරට මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනය සඳහා මුදල් සැපයීම වැළැක්වීමේ පද්ධති ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකාව දක්වන අඛණ්ඩ කැපවීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් මෙමගින් සනිටුහන් කෙරේ.

මෙම වාර්තාව මගින් 2024/25 ජාතික අවදානම් ඇගැයීම් වාර්තාව පිළිබඳ සාරාංශයක් සපයයි.

# ආ. සම්බන්ධීකරණය, දත්ත එක්රැස් කිරීම සහ විශ්ලේෂණය

මෙම ඇගැයීම සඳහා රාජ්‍ය සංවිධාන, පුද්ගලික අංශයේ ආයතන, ශ්‍රී ලංකා මහ බැංකුව සහ මූල්‍ය බුද්ධි ඒකකය ඇතුළු ආයතන 86ක් නියෝජනය කළ විශේෂඥයන් 200කගේ පමණ සහභාගීත්වයෙන් යුතුව සිදු කෙරුණි. ජාතික අවදානම ඇගැයීම සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධානතම කර්තව්‍යය මූල්‍ය බුද්ධි ඒකකය මගින් සිදු කෙරිණි. වෙළෙඳපොළ දෘෂ්ටිකෝණය සහ ගෝලීය සහ කලාපීය මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ තත්ත්ව සලකා බැලීම මගින් තවදුරටත් ශක්තිමත් කෙරුණි.

පෙර වසරෙහි ජාතික අවදානම් ඇගැයීමෙහි මෙන් ම, 2024/25 ජාතික අවදානම් ඇගැයීමෙහි දී ද ලෝක බැංකුවෙහි ක්‍රමවේදය යොදා ගැනීම සිදු කෙරුණි. 2021/22 ජාතික අවදානම් ඇගැයීමෙන් ආවරණය කෙරුණු මොඩියුල 13ට අමතර ව, වත්මන් ජාතික අවදානම් ඇගැයීම, ලෝක බැංකු ක්‍රමවේදය සහ ස්වයං ඇගැයීම් ක්‍රමවේදය භාවිත කරමින් පිළිවෙළින් බදු අපරාධ මොඩියුලය සහ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම ද ආවරණය කළ අතර, සම්පූර්ණ ඇගැයීම් ක්ෂේත්‍ර 15ක් ආවරණය වන ලෙස සිදු කරන ලදී තවද මෙම ඇගැයීම සිදු කිරීම සඳහා වැඩ කණ්ඩායම් (Working Group) 15ක් පිහිටුවා ඇත.

රූප සටහන 1 : ප්‍රධාන ඇගැයීම් ක්ෂේත්‍ර

| | | |
|---|---|---|
| 1 වන මොඩියුලය<br>මුදල් විශුද්ධිකරණ ජාතික තර්ජනය | 2 වන මොඩියුලය<br>මුදල් විශුද්ධිකරණ ජාතික අවදානමට ලක්වීමට ඇති නැමියාව | 3-7 දක්වා මොඩියුල<br>ආංශීය මුදල් විශුද්ධිකරණ අවදානමට ලක්වීමට ඇති නැමියාව |
| 8 වන මොඩියුලය<br>ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම | 9-14 දක්වා මොඩියුල<br>අනෙකුත් මොඩියුල | සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ ජාතික අවදානම |

මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම් ක්ෂේත්‍ර

- 1 වන මොඩියුලය: මුදල් විශුද්ධිකරණ ජාතික තර්ජනය
- 2 වන මොඩියුලය: මුදල් විශුද්ධිකරණ ජාතික අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 3 වන මොඩියුලය: බැංකු අංශය අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 4 වන මොඩියුලය: සුරකුම්පත් අංශය අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 5 වන මොඩියුලය: රක්ෂණ අංශය අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 6 වන මොඩියුලය: අනෙකුත් මූල්‍ය ආයතන අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 7 වන මොඩියුලය: නම් කරනලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන්වලට අවදානමට ලක්වීමට ඇති නැමියාව
- 8 වන මොඩියුලය: ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම
- 9 වන මොඩියුලය: මූල්‍ය අන්තර්ගතභාව නිෂ්පාදන අවදානම
- 10 වන මොඩියුලය: පාරිසරික සහ ස්වභාවික සම්පත් අපරාධයන්ට අදාල අවදානම
- 11 වන මොඩියුලය: ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අවභාවිතා වීමේ අවදානම ඇති ලාභ නොලබන සංවිධාන
- 12 වන මොඩියුලය: නීතිමය පුද්ගලයන්, නෛතික සැකසුම් සහ ප්‍රතිලාභ හිමිකාරීත්වය සම්බන්ධ අවදානම්
- 13 වන මොඩියුලය: අතථ්‍ය වත්කම් සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සම්බන්ධ අවදානම
- 14 වන මොඩියුලය: බදු අපරාධ සහ අවදානම
- 15 වන මොඩියුලය: සමූලඝාතක අවි මූල්‍යන ජාතික අවදානම

සවිස්තරාත්මක ඇගැයීමක් ආවරණය කිරීම පිණිස ප්‍රාථමික සහ ද්විතීයික මූලාශ්‍ර දෙක ම ඒකාබද්ධ කර ජාතික අවදානම් ඇගැයීම් දත්ත එක්රැස් කිරීම සිදු කෙරුණි. සම්මුඛ සාකච්ඡා, විශේෂඥ උපදේශන, වට මේස සාකච්ඡා, රැස්වීම්, මූල්‍ය බුද්ධි ඒකකය මගින් බැංකු අනුකූලතා නිළධාරීන්ගේ සංගමය (ACOB) සහ මූල්‍ය ආයතන සංගමය (FHA) සමග සිදු කළ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයේ සහායෙන් මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන්, ලාභ නොලබන සංවිධාන, අධීක්ෂණ බලධාරීන්, නීති බලාත්මක කිරීමේ ආයතන, සහ අදාළ වෙනත් පාර්ශ්වකරුවන් වෙත යොමු කළ ව්‍යුහාත්මක ප්‍රශ්නාවලි හරහා ප්‍රාථමික දත්ත එක්රැස් කිරීම සිදු කෙරුණි. ද්විතීයික දත්ත සඳහා දේශීය සහ විදේශීය වාර්තා,ආයතනික ප්‍රකාශන, නීතිමය ව්‍යවස්ථා සහ විවෘත මූලාශ්‍ර දත්ත මෙන්ම මූල්‍ය බුද්ධි ඒකකය, නීති බලාත්මක කිරීමේ ආයතන, විනිශ්චයකාරවරුන්, නීතිඥයන්, නියාමකයන් සහ අධීක්ෂණ අධිකාරීන්ගෙන් ලබාගත් සංඛ්‍යාත්මක සහ ගුණාත්මක දත්ත ඇතුළත් වේ. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ස්ථානීය සහ දුරස්ථ අධීක්ෂණවලින් ලද අධීක්ෂණ තොරතුරු ආංශික ඇගයීම්වලට ඇතුලත් කෙරුණු අතර, නියාමනය නොකළ සහ අවිධිමත් අංශ පිළිබඳ අදහස් විශේෂඥ මත, කාර්යාල පරීක්ෂණ සහ ප්‍රකාශයට පත් කෙරුණු අධ්‍යයන මගින් ලබා ගැණුනි. සමස්ත ඇගයීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ජාත්‍යන්තර යහපැවැත්මන් ද සැලකිල්ලට ගෙන ඇත.

එකතු කරගන්නා ලද දත්ත සහ තොරතුරු ලෝක බැංකුවෙහි මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් අවදානම් ඇගයීම් මෙවලම සහ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරු ක්‍රමවේදය භාවිත කරමින් විශ්ලේෂණය කෙරුණි. මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම්, තර්ජන සහ අවදානමට ලක්වීමට ඇති නැමියාව යන සාධකයන්ගේ එකතුවක් ලෙස ඇගැයීම් සිදු කෙරුණි. ලැබුණු ප්‍රතිඵල මත පදනම් ව, සෑම වැඩ කණ්ඩායමක් ම වෙන වෙන ම මොඩියුල වාර්තා නිර්මාණය කරන ලදී.

# ඇ. ප්‍රධාන සොයාගැනීම්

## ඇ.1. සමස්ත මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම

රූප සටහන 2 : සමස්ත මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම




**මුදල් විශුද්ධිකරණ ජාතික අවදානම**

ඉහළ ආදායමක් උපයාගන්නා නීතිවිරෝධී ක්‍රියාකාරකම් (මූලික වැරදි) මූලික කරගෙන, ශ්‍රී ලංකාවේ සමස්ත මුදල් විශුද්ධිකරණ ජාතික තර්ජන **මධ්‍යම** ලෙස තක්සේරු කෙරිණි. අවදානමට එරෙහිව ක්‍රියා කිරීමට ඇති ජාතික හැකියාව සහ ආංශික මුදල් විශුද්ධිකරණ අවදානම් සැලකිල්ලට ගනිමින්, සමස්ත මුදල් විශුද්ධිකරණ ජාතික අවදානමට ලක්වීමට ඇති හැකියාව ද **මධ්‍යම** ලෙස ඇගැයීම් කෙරුණි.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම**

එලෙසින්ම, ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම **ඉහළ මධ්‍යම** ලෙස ඇගැයීම් කෙරුණි.

| මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම ශ්‍රේණිගත කිරීම | අවදානම නිර්වචනය |
|---|---|
| ඉහළ | **ඉහළ අවදානම් කළමනාකරණය කිරීමට,වැඩිදියුණු කළ අවම කිරීමේ ක්‍රමවේද සහ අධීක්ෂණ දැක්මක අවශ්‍යතාව ඇති කරමින්, සැලකිය යුතු සමස්ත තර්ජන සහ අවදානම් රට මුදල් විශුද්ධිකරණයට/ත්‍රස්තවාදයට මුදල් සැපයීමට ලක් වීමට බෙහෙවින් හේතු වේ.** |
| ඉහළ මධ්‍යම | **සැලකිය යුතු මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් අවදානම් පවතින නමුත්, ඉහළ අවදානම් තරමට දැඩි නොවේ. තර්ජන සහ අවදානම් සැලකිය යුතු අතර, මධ්‍යම ඉහළ අවදානම් වළක්වා ගැනීමට අවධානය යොමු කළ අවම කිරීමේ උපායමාර්ග සහ වැඩිදියුණු කළ අධීක්ෂණයක් අවශ්‍ය වේ.** |
| මධ්‍යම | **තර්ජන සහ අවදානම් පවතින තුලිත මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සපයන අවදානම් පැතිකඩක් පවතින නමුත් කළමනාකරණය කරගත හැකි ය. පවත්නා පාලන ක්‍රම සාමාන්‍යයෙන් ඵලදායී වුවත්, අඛණ්ඩ අධීක්ෂණයක්, නිරීක්ෂණයක් සහ ඉලක්කගත ඉහළයැම් අවශ්‍ය වේ.** |
| පහළ මධ්‍යම | **ශක්තිමත් වළක්වාගැනීමේ ක්‍රමවේද සහ පාලන සහිත සීමිත මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් අවදානම් පවතී. තර්ජන සහ අවදානම් දෙක ම සුළු වන අතර, අවශ්‍යතාව අනුව සාමාන්‍ය නිරීක්ෂණ, ප්‍රමිතිගත අධීක්ෂණ ක්‍රියාමාර්ග සහ දැනුවත් කිරීම මගින් කළමනාකරණය කරගත හැකි ය.** |
| පහළ | **මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් තර්ජන** සහ **අවදානම්වලට අවම නිරාවරණයකි. අවදානම් වාතාවරණය ස්ථාවර වන අතර, ශක්තිමත් පාලනය සමග ඵලදායී වළක්වා ගැනීම සහ අවම කිරීම තහවුරු කරමින්, මූලික අධීක්ෂණයක් සහ දැනුවත් කිරීමක් පමණක් අවශ්‍ය වේ.** |

## ඇ.2. මුදල් විශුද්ධිකරණයට අදාළ ජාතික තර්ජනයන්ගේ සාරාංශය

රූප සටහන 3: මුදල් විශුද්ධිකරණ ජාතික තර්ජන මට්ටම්

| පහළ | පහළ මධ්‍යම | මධ්‍යම | ඉහළ මධ්‍යම | ඉහළ |
|---|---|---|---|---|

**ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණ තර්ජනවල සමස්ත ශ්‍රේණිගත කිරීම - මධ්‍යම**

**අපරාධ ක්‍රියාවන්ගෙන් ආදායම් ජනනය කරන වඩාත් ප්‍රචලිත බරපතල වැරදි**




| මුදල් විශුද්ධිකරණ ජාතික තර්ජන ශ්‍රේණිගත කිරීම | තර්ජනය නිර්වචනය |
|---|---|
| ඉහළ | **අපරාධ ක්‍රියාකාරකම් මගින් සැලකිය යුතු නීති විරෝධී ආදායම් ජනනය කිරීමේ ඉහළ සම්භාවිතාවක් පවතින අතර, දේශ සීමා හරහා සිදුවන ප්‍රවාහ පිළිබඳ සාක්ෂි අනුව, රට මුදල් විශුද්ධිකරණයට බෙහෙවින් නිරාවරණය කරන සංවිධානාත්මක අපරාධ ජාල පවතී.** |
| ඉහළ මධ්‍යම | **ඉහළ තර්ජන තත්ත්වයන්ට වඩා පුළුල් නොවන නමුත්, සාමාන්‍යයට වඩා වැඩි අපරාධ ක්‍රියාකාරකම් සිදුවීමේ සම්භාවිතාවක් සමග සැලකිය යුතු අනීතික මූල්‍ය ගලායෑම් මට්ටමක් පවතී. මෙම තර්ජන සඳහා තවදුරටත් වඩාත් දැඩි නිරීක්ෂණ සහ ඉලක්කගත නීති ක්‍රියාත්මක කිරීමේ පියවර අවශ්‍ය වේ.** |
| මධ්‍යම | **අපරාධ ක්‍රියාකාරකම් සිදුවීමේ මධ්‍යම මට්ටමේ සම්භාවිතාවක් සහ අනීතික ආදායම්වල මධ්‍යම මට්ටමක් නිරීක්ෂණය වේ. මුදල් විශුද්ධිකරණ තර්ජන පවතින නමුත්, ඒවා සාමාන්‍යයෙන් පවතින නීති ක්‍රියාත්මක කිරීමේ සහ වළක්වාගැනීමේ පියවර මගින් ඒවා කළමනාකරණය කළ හැකි ය.** |
| පහළ මධ්‍යම | **සීමිත අපරාධ ක්‍රියාකාරකම් සහ සාපේක්ෂව අඩු මූල්‍ය ගලායෑම් හඳුනාගෙන ඇත. ශක්තිමත් වළක්වා ගැනීමේ පද්ධති සහ බලාත්මක කිරීමේ හැකියාව හේතුවෙන් මුදල් විශුද්ධිකරණ තර්ජන ඉහළ යෑමේ සම්භාවිතාව අඩු කරයි.** |
| පහළ | **අපරාධ ක්‍රියාකාරකම් සිදුවීමේ අඩු/අවම සම්භාවිතාවක් සහ සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය නොවන අනීතික මුදල් උත්පාදනයක් පවතී. ඵලදායී ආරක්ෂා කිරීම තහවුරු කරමින් ශක්තිමත් පාලන සහ බලාත්මක කිරීම් මුදල් විශුද්ධිකරණය ඇති වීමේ හැකියාව අවම කරයි.** |

### මත්ද්‍රව්‍ය ජාවාරම

- ඉහළ මුදල් විශුද්ධිකරණ තර්ජනයක් ඇති කරන මෙතම්ෆිටමින් වර්ගයේ කෘත්‍රිම ඔපියොයිඩ් ජාවාරම ඉහළ යැමේ ප්‍රවණතාව සමග ශ්‍රී ලංකාව, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන රටක් ලෙස තවදුරටත් රැඳී සිටීම නිසා ඒ සම්බන්ධ මුදල් විශුද්ධිකරණ තර්ජනය **ඉහළ** මට්ටමක පවතී..

- ඉදිරි ගමනාන්ත ඉලක්ක කරගනිමින් කුඩා පරිමාණයේ කොකේන් ජාවාරම් නිරීක්ෂණය වී ඇති අතර, ඒවා බොහෝ දුරට භාණ්ඩ තුළ සඟවා ගුවන් මගින් හොර රහසේ ප්‍රවාහනය කරයි.

- විවිධ සන්නිවේදන ක්‍රම භාවිතා කරමින් ක්‍රියා පටිපාටිය වෙනස් කිරීම විමර්ශන සංකීර්ණ බවට පත් කරයි.

- අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි නීතිය බලාත්මක කිරීමේ ප්‍රධාන ආයතන මගින් කෙරෙන මර්දනයන් තීව්‍ර වී ඇති අතර, එමගින් අත්අඩංගුවට ගැනීම් සැලකිය යුතු ප්‍රමාණයක් සිදු කිරීම මගින් වෙළෙඳපොළ යම්තාක් දුරකට මැඩපවත්වා ඇත. එසේ වෙතත්, හෙරොයින් ජාවාරමට සම්බන්ධව සමූහ වශයෙන් සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයන්ට අභියෝගයක් වී ඇත.

### වංචා

- ඉහළ වටිනාකම් ගනුදෙනු, වාර්තා වූ සිදුවීම්වල ඉහළ යාම සහ මූල්‍ය ආයතනවල නිෂ්පාදන/බෙදාහැරීමේ මාර්ග අනිසි ලෙස භාවිතය, **ඉහළ මධ්‍යම** මට්ටමක මුදල් විශුද්ධිකරණ තර්ජනයක් පෙන්නුම් කරයි.

- ප්‍රධාන වශයෙන් විදේශිකයන් ඉලක්ක කරගත්, විදේශීය වංචාකරුවන් විසින් නායකත්වය දෙන ‘scam farms’ සම්බන්ධයෙන් කළ නවතම විමර්ශන කිහිපයක් මගින් ‘pig-butchering’ යනුවෙන් වර්ධනය වන තර්ජනයක් පිළිබඳ ව හඳුන්වා දෙයි.

- සමාජ මාධ්‍ය, ක්ෂණික පණිවිඩ සහ වැට් වෙබ් අඩවි හරහා ප්‍රචාරය කෙරෙන වංචනික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නැගී එන තර්ජනයන් ඉස්මතු කරයි.

- ශ්‍රී ලංකා මහ බැංකුව සහ නීති බලාත්මක කිරීමේ ආයතන සමග එක්ව සිදු කළ මහජන දැනුවත් කිරීම් ඇතුළු ව, ජාතික මට්ටමේ ඉලක්කගත විමර්ශන, හඳුනාගැනීම් සහ ඒවා අවහිර කිරීමේ ප්‍රයත්න ඉහළ ප්‍රතිඵල අත්කර දී ඇත.

### රේගු සම්බන්ධ වැරදි/වෙළෙඳාම පදනම් මුදල් විශුද්ධිකරණය

- නීති විරෝධී මූල්‍ය ප්‍රවාහ හා සම්බන්ධ වූ වෙළෙඳාම පදනම් භාණ්ඩ ප්‍රවාහ ක්‍රමයක් පවතින බව, ඒ හා සම්බන්ධ වූ ඉහළ සිදුවීම් සංඛ්‍යාවක් සහ පනවන ලද විශාල දඩ මුදල් මගින් නිරූපණය කරයි.

- ශ්‍රී ලංකා රේගුව, බැංකු සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් මෑත කාලීන ව ගන්නා ලද ක්‍රියාමාර්ග නීති විරෝධී මුදල් ප්‍රවාහ අවම කිරීමට ගනු ලබන ජාතික ප්‍රයත්නයන් පිළිබිඹු කරයි.

- ශ්‍රී ලංකා රේගුව විසින් මුදල් විශුද්ධිකරණය පිළිබඳ ව විමර්ශනය කරන නීති බලාත්මක කිරීමේ ආයතන වෙත සිදු කළ යොමු කිරීම් සීමා වීම සහ රේගු අපරාධයන් සම්බන්ධයෙන් මුදල් විශුද්ධිකරණ විමර්ශන අඩු මට්ටමක පැවතීම හේතුවෙන් මෙය **ඉහළ මධ්‍යම** මට්ටමක තර්ජනයක් පෙන්නුම් කරයි.

## ශ්‍රී ලංකාවේ අනෙකුත් අපරාධ වර්ග

### අල්ලස් සහ දූෂණ

- **2023** සැප්තැම්බර් මස සිට නව අණපනත් මගින් අල්ලස්, දූෂණ සහ වත්කම් අපරාධවලට සම්බන්ධ විමර්ශන **තවදුරටත්** ශක්තිමත් විය.
- **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම** විසින් ඉහළ අවධානයකට ලක් වූ සහ විශාල දූෂණ විමර්ශනය **කිරීම සඳහා** නව ප්‍රවේශයක් භාවිතා කරයි.
- මෙම ප්‍රයත්න මහජන මතය ධනාත්මක කරමින් දූෂණ තුරන් කිරීමේ උත්සාහයන්ට සහාය දී ඇත.
- මුදල් විශුද්ධිකරණ විමර්ශන බලතල, නඩු සහ **වළක්වාලීමේ** ක්‍රියාමාර්ග **මධ්‍යම** මට්ටමේ මුදල් විශුද්ධිකරණ තර්ජනයක් පිළිබඳ සලකුණු පිළිබිඹු කරයි.

### මිනිස් ජාවාරම

- බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම, ලිංගික සූරාකෑම, සංක්‍රමණික වෙළඳාම (ගමනාගමන සහ ගමනාන්ත ජාවාරම) යනාදිය ප්‍රධාන වශයෙන් මිනිස් ජාවාරම සම්බන්ධ සිද්ධීන් ලෙස පෙන්නුම් කරයි.
- අවයව ජාවාරම සහ බලහත්කාර අපරාධ සඳහා ජාවාරම් සීමිත ව සිදු වේ.
- රටේ සමාජ-ආර්ථික සහ භූ දේශපාලනික යථාර්ථයන් හේතුවෙන් මිනිස් ජාවාරම හා සම්බන්ධ තර්ජන මධ්‍යස්ථ වශයෙන් වර්ධනය වී ඇත.
- වංචනික බඳවා ගැනීමේ නියෝජිතයන් විසින් සූරාකෑමෙන්, ව්‍යාජ ලියකියවිලි සහ වෙන් කිරීමට ලක් වූ ප්‍රජාවන් ඉලක්ක කරගත් ජාවාරම්වලින් හිමිවන මූල්‍යමය වාසි.
- සිද්ධීන් පැවතිය ද, හඳුනාගත් මුදල් විශුද්ධිකරණයෙන් උපයාගත් ආදායම් අවම වීම සමග නඩු පැවරීම් අවම ලෙස පවතී. ඒ අනුව, මිනිස් ජාවාරම සම්බන්ධ මුදල් විශුද්ධිකරණ තර්ජනය **මධ්‍යම** මට්ටමක පවතින බව තක්සේරු කෙරිණි.

### මංකොල්ලකෑම්

- මංකොල්ලකෑම්, ගෙවල් බිඳීම් සහ කප්පම් ගැනීම් කාල සීමාව පුරාම ස්ථාවර ව පැවතුණි.
- **2023** දී දක්නට ලැබුණු ආර්ථික පීඩන හේතුවෙන් අනාවරණය, විමර්ශන, නඩු පැවරීම් සහ වරදකරු කිරීමේ අදියරවල සැලකිය යුතු වැඩිවීමක් පැවති අතර සහ පසුව වාර්ෂික සාමාන්‍ය මට්ටම්වලට සමීප විය.
- ඉහළ විමර්ශන සංඛ්‍යාව හා සසඳන විට, නඩු පැවරීම් සීමා සහිත ව පවතින අතර වරදකරු කිරීමේ මට්ටම අඩු ය.
- මංකොල්ලකෑම්වලින් උපයා ගත් ආදායම්හි අඩු වීම සහ සංකීර්ණභාවය, පරිභෝජන රටා ඉලක්ක කරමින් ඇති වූ ප්‍රතිලාභ, සහ නීති බලාත්මක කිරීමේ ප්‍රවණතා යන කරුණු, මුදල් විශුද්ධිකරණ තර්ජන **මධ්‍යම** මට්ටමක පවතින බව පෙන්වයි.

### පාරිසරික හා ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධ

- වන ජීවී, වන වගා, ධීවර, පතල්, අපද්‍රව්‍ය සහ දූෂණය සහ අනෙකුත් සම්බන්ධිත වැරදි මෙහිදී තක්සේරු කරන ලදී.
- පාරිසරික හා ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධ පරිසර පද්ධතියට සහ අපරාධකාරී භූ දර්ශනයට මධ්‍යස්ථ බලපෑමක් ඇති කිරීමේ සම්භාවිතාවක් පෙන්නුම් කරයි.
- **2022-2025** කාලය තුළ පාරිසරික හා ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධ සඳහා පරිපාලන සම්බාධක, විමර්ශන, නඩු පැවරීම් සහ වරදකරුවන් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කර ඇත.
- පාරිසරික හා ස්වභාවික සම්පත් ආශ්‍රිත අපරාධ අවදානම් මොඩියුලයේ සොයාගැනීම්, මුදල් විශුද්ධිකරණ තර්ජනය **මධ්‍යම** ලෙස පිළිබිඹු කරයි.

### නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් මසුන් සම්බන්ධ ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකාවේ මුහුදු මාර්ග මිනිස් ජාවාරම සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැනි වෙනත් පුරෝකථනය කළ වැරදි සඳහා අනිසි ලෙස භාවිතා කළ හැකි අතර, සමහරක් නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වේ.
- නිරීක්ෂණය කරන ලද සිදුවීම් මගින් සමුද්‍රීය/ධීවර යාත්‍රා සහ ඒවායෙහි කාර්යමණ්ඩලය සංවිධානාත්මක අපරාධ ජාල සමග ද්විත්ව සම්බන්ධතා පවත්වන බව වාර්තා වේ.
- බහුදින ධීවර යාත්‍රා, ධීවර වරායන්හි ගොඩබෑම් අඩුවෙන් නිරීක්ෂණය කිරීම හේතුවෙන් අවදානමට නැමියාවක් ඇති වේ.
- ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළාරක්ෂක බලකාය, රේගුව එක්ව ක්‍රියාකිරීමත් සමග ශක්තිමත් අවම කිරීමේ යාන්ත්‍රණයක් ආරම්භ විය.
- දකුණු වෙරළ මාර්ගය, ධීවර වෙළඳාම, ඉහළ මුදල් භාවිතය සහ අවිධිමත් වෙළඳපොළ හේතුවෙන් මේ හා සම්බන්ධ තර්ජන මට්ටම **මධ්‍යම** ලෙස තක්සේරු කෙරිණි.

## බදු අපරාධ

- බදු අපරාධ තර්ජන ඇගැයීමේ දී ඍජු සහ වක්‍ර යන බදු දෙවර්ගය ම සලකා බලන ලදී.
- බදු ගෙවන්නන්ගේ මධ්‍යම මට්ටමේ අනුකූලතා හැසිරීමක් පිළිබිඹු කරමින්, ඇගැයීම් කාල සීමාවෙහි දී ඍජු සහ වක්‍ර බදු සඳහා ප්‍රතිලාභ අනුකූලතාව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.
- ශ්‍රී ලංකාවේ පළමු බදුගෙවන්නන්ගේ ජාතික අධ්‍යයනය 2024 සහ ගෝලීය සංවිධානාත්මක අපරාධ දර්ශකය - 2023 මගින් රට තුළ බදු පැහැර හැරීම් පවතින බව යෝජනා කරන අතර කලාපීය සමකාලීනයන් සමග සැසඳීමේ දී එහි ව්‍යාප්තිය සහ බලපෑම මධ්‍යස්ථ මට්ටමක පවතී.
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ නව බදු අපරාධ විමර්ශන ඒකකය ස්ථාපිත කිරීමත් සමග 2024-2025 කාලය තුළ බදු අපරාධ විමර්ශන කිහිපයක් ආරම්භ කරන ලදී.
- බදු අපරාධ මොඩියුල ඇගැයීමෙහි සොයාගැනීම්, **මධ්‍යම** මට්ටමේ මුදල් විශුද්ධිකරණ තර්ජනයක් පිළිබිඹු කරයි.

## සුරාබදු ආඥාපනත යටතේ උල්ලංඝනය කිරීම

- **2019** සහ **2024** අතර කාලයේ දී, සුරාබදු දෙපාර්තමේන්තුව මගින් කංසා සන්තකයේ තබා ගැනීම වැඩිම අවස්ථා ගණනාවක දී අනාවරණය කරගත් අතර, හෙරොයින් සොයා ගැනීම් කිහිපයක් ද වාර්තා විය.
- සමස්ත සොයා ගැනීම්වල ප්‍රමාණය සහ වාර ගණන, මූල්‍ය සංකීර්ණතා අඩු මට්ටමක ඇති බව සහ බොහෝ අපරාධ පරිභෝජන රටා පෙන්නුම් කරන බව පෙන්වයි.
- අත්අඩංගුවට ගැනීම්වල සාපේක්ෂ මධ්‍යස්ථ පරිමාව සහ නඩු පැවරීම් සම්බන්ධ අඩු අගයන් සැලකිල්ලට ගෙන, මුදල් විශුද්ධිකරණ තර්ජනය **පහළ මධ්‍යම** ලෙස ශ්‍රේණිගත කර ඇත.

## මුදල් ව්‍යාජානුකරණය

- අපරාධ වර්ගයට අදාළ සිදුවීම් අඩු වන අතර මුදල් විශුද්ධිකරණ ප්‍රයත්න ඇත් නම් ආරම්භක අවස්ථාවේ දී හඳුනාගෙන වළක්වාගෙන ඇත.
- අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව සහ නඩු පැවරීමට අදාල වටිනාකම් සාපේක්ෂ ව මධ්‍යස්ථ මට්ටමක පවතින බැවින්, මුදල් විශුද්ධිකරණ තර්ජනය තවදුරටත් **පහළ** මට්ටමක පවතී.

## ඇ.3. මුදල් විශුද්ධිකරණ ජාතික අවදානමේ සාරාංශය

**රූප සටහන 4: මුදල් විශුද්ධිකරණ ජාතික අවදානම**




| මුදල් විශුද්ධිකරණ ජාතික අවදානම ශ්‍රේණිගත කිරීම | | අවදානම නිර්වචනය |
|---|---|---|
| ඉහළ | (රතු) | රට මුදල් විශුද්ධිකරණයට සැලකිය යුතු සහ පද්ධතිමය නිරාවරණයකට මුහුණ දෙයි.ජාතික මට්ටමේ මර්දන හැකියාව දුර්වල වීම සහ/හෝ අංශ මට්ටමේ අවදානම් ඉහළ වීම, වළක්වා ගැනීම, හඳුනාගැනීම සහ නීති ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රයන්හි විශාල හිඩැස් නිර්මාණය කරයි. |
| මධ්‍යම ඉහළ | (තැඹිලි) | ජාතික මර්දන හැකියාවේ හෝ විශේෂිත අංශ එකක හෝ වැඩි ගණනක සැලකිය යුතු දුර්වලතා හේතුවෙන් රට තුළ සැලකිය යුතු අවදානම් ඇති වී තිබේ. ඇතැම් පාලන පැවතිය ද, ඒවා ප්‍රධාන අවදානම් අවම කිරීමට ප්‍රමාණවත් තරම් ඵලදායී නොවේ. |
| මධ්‍යම | (කහ) | ජාතික සහ ආංශික පාලන අවදානම් කිහිපයක් අවම කරන නමුත් අසමාන ක්‍රියාත්මක කිරීම හෝ නිශ්චිත ආංශික දුර්වලතා හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් පවතී. |
| මධ්‍යම පහළ | (ලා කොළ) | සීමිත අවදානම් පමණක් සමග ජාතික සහ ආංශික මට්ටම්වල පාලන සාමාන්‍යයෙන් ශක්තිමත් සහ ඵලදායී වේ. හඳුනාගත් හිඩැස් ඇතුළත් කර, නිරීක්ෂණය කර, සක්‍රීය අවම කිරීමට යටත් වේ. |
| පහළ | (කොළ) | රට තුළ ශක්තිමත් ආංශික පාලනයන් මගින් සහාය දක්වන ශක්තිමත්, පරිණත සහ අඛණ්ඩ ඵලදායී මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රාමුවක් ඇත. අවදානම් අවම වන අතර හොඳින් කළමනාකරණය කෙරේ. |

## ජාතික වශයෙන් මුදල් විශුද්ධිකරණ අවදානමට ලක්වීමට ඇති නැමියාව

ආංශික මට්ටමෙන් මුදල් විශුද්ධිකරණ අවදානමට ලක්වීමට ඇති නැමියාව අවම කිරීමට සහ ඒවාට ප්‍රතිචාර දැක්වීමට රටට ඇති සමස්ත හැකියාව විමසා බැලීමෙන්, ශ්‍රී ලංකාව ජාතික වශයෙන් මුදල් විශුද්ධිකරණ අවදානමට ලක්වීමට ඇති නැමියාව තක්සේරු කරන ලදී. මෙම ඇගයීමේ දී නඩු පවරන්නන්ගේ සහ ශ්‍රී ලංකා පොලිසිය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ඇතුළු නීති ක්‍රියාත්මක කිරීමේ ආයතනවල දේශීය නීතිමය හා ආයතනික රාමුවේ කාර්යක්ෂමතාව සමාලෝචනය කෙරිණි. නීතීන්හි ප්‍රමාණවත්භාවය, පුහුණු මට්ටම්, අඛණ්ඩතාව, සම්පත් පැවතීම, සහ ආයතන අතර සම්බන්ධීකරණය යන කරුණු මෙහිදී ප්‍රධාන වශයෙන්ම සළකා බලන ලදී.

මෙම ඇගයීම මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රාමුව ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ප්‍රගතියක් සිදුව ඇති බව සටහන් කරන ලදී. එහිදී නීතිමය හා නියාමන ව්‍යුහයන්හි වර්ධනයක් ඇතිවීමත්, අදාළ බලධාරී ආයතන තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ විශේෂිත ඒකක ස්ථාපනය කිරීමත්, ආයතන අතර සම්බන්ධීකරණය සඳහා වැඩකරන කණ්ඩායම් පිහිටුවීමත් දක්නට ලැබුණි. තව ද, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ පුහුණු හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් හේතුවෙන් වාර්තාකරණ ආයතන සහ මේ සම්බන්ධ පාර්ශ්වකරුවන්ගේ හැකියාව හා දැනුවත්භාවය වැඩිවීම, නව තාක්ෂණ භාවිත කිරීම ඇතුළු ව අන්තර් ආයතනික සහ බුද්ධි තොරතුරු හුවමාරුව වැඩි දියුණු වීම වැනි අනෙකුත් වර්ධනයන් ද මෙම ඇගැයීම අතරතුර දී නිරීක්ෂණය කෙරුණි.

මෙම වර්ධන මධ්‍යයේ වුව ද, සම්පූර්ණයෙන් මධ්‍යගත කරන ලද ඩිජිටල් දත්ත ගබඩාවක අවශ්‍යතාවය සහ මුදල් විශුද්ධිකරණ විමර්ශන සහ නඩු පැවරීම් සඳහා බලපාන සම්පත් සීමිත වීම් ආවරණය කිරීම වැනි පවත්නා හිඩැස් ආවරණය කරගැනීමේ අවශ්‍යතාවය පිළිබිඹු කරමින් මුදල් විශුද්ධිකරණය අවදානම සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත නැමියාව තවදුරටත් **මධ්‍යම** මට්ටමක පවතී.

# ඇ.5. ආංශීය මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම් අවදානමේ සාරාංශය

රූප සටහන 5: ආංශීය මුදල් විශුද්ධිකරණ අවදානම

| ඉහළ මධ්‍යම | මධ්‍යම | පහළ මධ්‍යම | පහළ |
|---|---|---|---|
| • බැංකු<br>• මූල්‍ය සමාගම්<br>• කැසිනෝ<br>• දේපළ වෙළඳාම්<br>• වටිනා ලෝහ, මැණික් ගල් සහ අඩ මැණික් ගල් අලෙවිකරුවන්<br>• අවිධිමත් මුදල් හුවමාරු සේවා | • කොටස් තැරැව්කරුවන්<br>• ප්‍රාථමික අලෙවිකරුවන්<br>• රක්ෂණ<br>• භාර සහ සමාගම් සේවා සපයන්නන්<br>• නීතිඥවරු සහ නොතාරිස්වරු<br>• මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් | • ගණකාධිකාරීවරු<br>• ඒකක භාර සහ ආයෝජන කළමනාකරුවන්<br>• විද්‍යුත් මුදල් සේවා සපයන්නන්<br>• සමූපකාර සමාගම්<br>• සමෘද්ධි බැංකු<br>• නියාමනය නොවන ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්<br>• අවිධිමත් උකස් තැරැව්කරුවන්<br>• අවිධිමත් මුදල් ණයට දෙන්නන්<br>• පරිසීමිත වෙළෙන්දන්<br>• බලපත්‍ර ලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම | • කල්බදු සමාගම් |

රූප සටහන 6: ආංශීය ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම

| මධ්‍යම | පහළ මධ්‍යම |
|---|---|
| • අවිධිමත් මුදල් හුවමාරු සේවා | • බැංකු<br>• මූල්‍ය සමාගම්<br>• මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්<br>• කොටස් තැරැව්කරුවන්<br>• ප්‍රාථමික අලෙවිකරුවන්<br>• රක්ෂණ<br>• විද්‍යුත් මුදල් සේවා සපයනන්න<br>• සමූපකාර සමාගම්<br>• සමෘද්ධි බැංකු<br>• පරිසීමිත වෙළෙන්දන්<br>• බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්<br>• කල්බදු සමාගම්<br>• දේපළ වෙළඳාම්<br>• කැසිනෝ<br>• නීතිඥවරු සහ නොතාරිස්වරු<br>• වටිනා ලෝහ, මැණික් ගල් සහ අඩ මැණික් ගල් අලෙවිකරුවන්<br>• ගණකාධිකාරීවරු<br>• භාර සහ සමාගම් සේවා සපයන්නන්<br>• නියාමනය නොවන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන<br>• අවිධිමත් උකස් තැරැව්කරුවන්<br>• අවිධිමත් මුදල් ණයට දෙන්නන් |

## බැංකු අංශය

**මුදල් විශුද්ධිකරණ අවදානම – ඉහළ මධ්‍යම**

බැංකු අංශය තුළ **ඉහළ මධ්‍යම** මට්ටමේ මුදල් විශුද්ධිකරණ අවදානමක් පවතින බවට තක්සේරු කර ඇති අතර තර්ජන ඉහළ මට්ටමේ පැවතීම සහ අවදානමට ලක් වීමට ඇති හැකියාව මධ්‍යම මට්ටමේ පැවතීම ඊට හේතු වී ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ ශක්තිමත් රාමු, අවදානම් පාදක අධීක්ෂණ සහ සැක කටයුතු ගනුදෙනු වාර්තාකරණය ශක්තිමත් කිරීම මගින් අවදානම් අවම වුව ද, බලාත්මක කිරීමේ සීමා, පාරිභෝගික තොරතුරු තහවුරු කිරීම් වල පවතින දුර්වලතා සහ ඇතැම් නිෂ්පාදන සම්බන්ධයෙන් පවතින ඊට ආවේණික අවදානම යන කරුණු හේතුවෙන් අවදානමට ලක් වීමට ඇති අවශේෂිත නැමියාව තවදුරටත් පවතී. තව ද, මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් හඳුනාගත් සිදුවීම් බහුතරයක් බැංකු අංශය සහ එහි පවතින ස්ථාවර තැන්පතු වැනි නිෂ්පාදන සමග සම්බන්ධ වී ඇත. එවැනි සිදුවීම්වල විශාලත්වය, මූල්‍ය වත්කම් ඒකරාශී වීම සහ ගනුදෙනු වටිනාකම සැලකිල්ලට ගත් විට බැංකු ක්ෂේත්‍රයේ තුළ පවතින ඒ සම්බන්ධ තර්ජන ඉහළ මට්ටමක පවතී.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම – පහළ මධ්‍යම**

ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධයෙන් රටේ පවතින තර්ජන සමස්තයක් ලෙස ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශය තුළ පවතින ඒ සම්බන්ධ අවදානම **පහළ මධ්‍යම** මට්ටමක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. කෙසේ වුව ද, ක්ෂේත්‍රයේ පවතින පාලන රාමුව නොවෙනස් ව පවතී.

## සුරැකුම්පත් අංශය

**මුදල් විශුද්ධිකරණ අවදානම – මධ්‍යම**

ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් අංශය **මධ්‍යම** මට්ටමේ මුදල් විශුද්ධිකරණ අවදානම් සහිත ක්ෂේත්‍රයක් බවට තක්සේරු කර ඇති අතර, ලැයිස්තුගත මූල්‍ය උපකරණවල පවතින ඉහළ ද්‍රවශීලතාව, ඊට අදාලව නිරාවරණය වීම මධ්‍යස්ථ මට්ටමක පැවතීම, සැකකටයුතු ගනුදෙනු වාර්තාකරණයේ පවතින අවම මට්ටම සහ ධාරිතා සීමා මෙම තත්ත්වයට හේතු වී ඇත. කෙසේ වුව ද, ශක්තිමත් නෛතික රාමුවක් පැවතීම, පාලන සහ අධීක්ෂණ කටයුතු පුළුල් කිරීම මගින්, මෙම මධ්‍යම මට්ටමේ අවදානම් අවම කර ගැනීමට හැකි වී තිබේ.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම – පහළ මධ්‍යම**

ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම්, පෙර තක්සේරුවේ පැවති පහළ මට්ටමේ සිට **පහළ මධ්‍යම** මට්ටම දක්වා ඉහළ ගොස් ඇති බව තක්සේරු කර ඇති අතර, මෙම ක්ෂේත්‍රයේ පාලන ක්‍රමවේද ශක්තිමත් කිරීම සහ දැනුවත්භාවය පුළුල් කිරීම සිදු කළ ද ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ රටේ සමස්ත තර්ජන මධ්‍යම මට්ටමේ සිට ඉහළ මධ්‍යම මට්ටම දක්වා ඉහළ යාම මීට හේතු වී ඇත.

## රක්ෂණ අංශය

**මුදල් විශුද්ධිකරණ අවදානම – මධ්‍යම**

ජීවිත රක්ෂණ ක්‍රම ව්‍යාප්ත වීම, වාරික මුදල් ප්‍රමාණය ඉහළ යෑම, අතරමැදියන්ගේ මැදිහත්වීම් පුළුල් වීම සහ පාරිභෝගික ගනුදෙනුවල සංකීර්ණතාව ඉහළ යාම හේතුවෙන් රක්ෂණ ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණ අවදානම් ඉහළ ගොස් ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පාලන ක්‍රමවේදයන් පැවතිය ද, සැක කටයුතු ගනුදෙනු වාර්තාකරණය සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවතීම සහ මුදල් ගනුදෙනු සඳහා පවතින නිරාවරණය වැඩි වීම මුදල් විශුද්ධිකරණ අවදානම් තීව්‍ර වීමට හේතු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත මුදල් විශුද්ධිකරණ අවදානම් මට්ටම පහළ මධ්‍යම මට්ටමේ සිට **මධ්‍යම** මට්ටම දක්වා ඉහළ ගොස් ඇත.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම – පහළ මධ්‍යම**

ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික තර්ජන මධ්‍යම මට්ටමේ සිට ඉහළ මධ්‍යම මට්ටම දක්වා වර්ධනය වීම හේතුවෙන්, රක්ෂණ අංශයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ සමස්ත තර්ජන පහළ මට්ටමේ සිට **පහළ මධ්‍යම** මට්ටම දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර ආංශික පාලන ක්‍රමවේදයන් නොවෙනස් ව පවතී.

# අනෙකුත් මූල්‍ය ආයතන

**මුදල් විශුද්ධිකරණ අවදානම:**

අනෙකුත් මූල්‍ය ආයතන අතරින්, මූල්‍ය සමාගම් සහ අවිධිමත් මුදල් හුවමාරු සේවා ඉහළ මධ්‍යම මට්ටමේ මුදල් විශුද්ධිකරණ අවදානමක් පෙන්නුම් කරන අතර අධික ලෙස මුදල් පරිහරණය වන ක්‍රියාවලින්/නිෂ්පාදන, මූල්‍යමය වශයෙන් දුර්වල පාරිභෝගිකයින් සහ නීති විරෝධී මුදල් ගනුදෙනු සඳහා අවභාවිත වීමට ඇති සම්භාවිතාව මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මෑත කාලීන ව හඳුන්වා දුන් රෙගුලාසි ඇතුළු දැනට පවතින නියාමන අධීක්ෂණ සහ ව්‍යවස්ථාදායකමය මුලපිරීම් පදනම් කර ගනිමින් මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් මධ්‍යම අවදානම් මට්ටමක් සහිත කාණ්ඩයක් ලෙස තක්සේරු කර ඇත. විද්‍යුත් මුදල් සේවා සපයන්නන්, සමුපකාර සමිති, සමෘද්ධි බැංකු, නියාමනය නොවන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, පරිසීමිත වෙළෙන්දන් සහ බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පහළ මධ්‍යම අවදානම් සහිත ආයතන ලෙස තක්සේරු කර ඇති අතර, නියෝජිත අධීක්ෂණ යාන්ත්‍රණයන් පැවතීම, සමීප ව සිදු කෙරෙන නියාමන අධීක්ෂණය සහ අඩු ආදායම්ලාභී ප්‍රජාවට සේවය සැපයීම යන කරුණු මෙයට හේතු වී ඇත. අවිධිමත් උකස්කරුවන් සහ අවිධිමත් ලෙස ණය ලබා දෙන්නන් ද පහළ මධ්‍යම අවදානම් මට්ටමක පවතින බව තක්සේරු කර ඇති අතර විධිමත් මූල්‍ය අංශයේ නියාමනය ශක්තිමත් වීම සහ සීමා සහිත නිෂ්පාදන පරාසයේ වක්‍ර බලපෑම් ඊට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කල්බදු ආයතනයන් මුදල් වලට නිරාවරණය සීමා වීම, ආයතන සංඛ්‍යාව පහළ මට්ටමක පැවතීම සහ නියාමන පාලන සාපේක්ෂ වශයෙන් ශක්තිමත් වීම හේතුවෙන් එම ආයතන පහළ අවදානම් මට්ටමක පවතින ආයතන ලෙස තක්සේරු කර ඇත.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම:**

අනෙකුත් මූල්‍ය ආයතනවල අනු කාණ්ඩ හතරක් සඳහා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් තක්සේරු කර ඇත. රටේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ සමස්ත තර්ජන මධ්‍යම මට්ටමේ සිට ඉහළ මධ්‍යම මට්ටම දක්වා ඉහළ ගිය ද, **2021/22** ජාතික අවදානම් ඇගැයීම මඟින් මධ්‍යම මට්ටමේ පවතින බව තක්සේරු කළ අවිධිමත් මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා අංශයේ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම එම මට්ටමේ නොවෙනස් ව පැවතුනු අතර මෙම අංශය තුළ පාලන ක්‍රමවේදයන් පුළුල් කිරීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්, නියාමනය වන අනෙකුත් මූල්‍ය ආයතන සහ නියාමනය නොවන අනෙකුත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම පහළ මධ්‍යම මට්ටමේ පවතින බව **2021/22** ජාතික අවදානම් ඇගැයීම මඟින් තක්සේරු කළ අතර එය තවදුරටත් නොවෙනස් ව පවතී. ආංශික මට්ටමේ පාලනයන්වල සැලකිය යුතු අන්දමේ වෙනස්කම් සිදු නොවීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා ඇති නිරාවරණය සීමා වීම මෙම තත්ත්වයට හේතු වී ඇත.

# නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්

**මුදල් විශුද්ධිකරණ අවදානම:**

කැසිනෝ ව්‍යාපාර, නිශ්චල දේපළ නියෝජිතයින් සහ වටිනා ලෝහ සහ මැණික් අලෙවිකරුවන් ඉහළ මධ්‍යම මුදල් විශුද්ධිකරණ අවදානමක් සහිත අංශ ලෙස තක්සේරු කර ඇත. මෙම ඇගැයීම සඳහා කැසිනෝ ව්‍යාපාරයේ සහ නිශ්චල දේපළ වෙළෙඳාම් අංශයේ පවතින ඉහළ මධ්‍යම මට්ටමේ තර්ජන සහ වටිනා ලෝහ සහ මැණික් අලෙවි අංශයේ මධ්‍යම මට්ටමේ තර්ජන මෙන් ම එම අංශ තුනෙහි ම මුදල් විශුද්ධිකරණ අවදානමට ලක් වීමට ඇති හැකියාව ඉහළ මධ්‍යම මට්ටමක පැවතීම හේතු වී ඇත. කැසිනෝ ව්‍යාපාරය සහ වටිනා ලෝහ සහ මැණික් අලෙවිකරණ අංශවල විශාලත්වය සහ එම අංශ අධික ලෙස මුදල් භාවිත කිරීම එම අංශවල මුදල් විශුද්ධිකරණ අවදානම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. නිශ්චල දේපළ වෙළෙඳාම් නියෝජිතයින්ගේ මුදල් විශුද්ධිකරණ අවදානම් මට්ටම පෙර ඇගැයීමට සාපේක්ෂ ව නොවෙනස් ව පවතී.

නීතිඥවරුන්, නොතාරිස්වරුන් සහ අනෙකුත් ස්වාධීන නීති වෘත්තිකයින් මෙන් ම භාර සහ සමාගම් සේවා සපයන්නන්ට අදාළ මුදල් විශුද්ධිකරණ අවදානම මධ්‍යම මට්ටමේ පවතින බව තක්සේරු කර ඇති අතර, එම අංශ සඳහා පවතින තර්ජන මට්ටම් පිළිවෙළින් මධ්‍යම සහ පහළ මධ්‍යම මට්ටමේ පැවතීම සහ අවදානමට ලක්වීමට ඇති හැකියාව මධ්‍යම මට්ටමේ පැවතීම ඒ සඳහා හේතු වී ඇත. නීතිඥවරුන්, නොතාරිස්වරුන් සහ අනෙකුත් ස්වාධීන නීති වෘත්තිකයින්ගේ මුදල් විශුද්ධිකරණ අවදානම් පෙර ඇගැයීමට සාපේක්ෂ ව මධ්‍යම මට්ටමක නොවෙනස් ව පැවති අතර, මුදල් විශුද්ධිකරණ අවදානම් ඇති වීමට පවතින හැකියාව සුළු වශයෙන් ඉහළ යෑම හේතුවෙන් භාර සහ සමාගම් සේවා සපයන්නන්ගේ මුදල් විශුද්ධිකරණ අවදානම පහළ මධ්‍යම මට්ටමේ සිට මධ්‍යම මට්ටම දක්වා ඉහළ ගියේ ය.

ගණකාධිකාරිවරුන්ගේ මුදල් විශුද්ධිකරණ අවදානම පහළ මධ්‍යම මට්ටමේ තක්සේරු කර ඇති අතර, තර්ජන සහ අවදානමට ලක්වීමට ඇති හැකියාව පහළ මධ්‍යම මට්ටමක පැවතීම මෙයට හේතු වී ඇත. පෙර ඇගැයීමට සාපේක්ෂ ව අවදානම් මට්ටම නොවෙනස් ව පවතී. සියලු ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් පුරා, ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ යාන්ත්‍රණ සහ වෘත්තිමය බැඳීම් හරහා නිර්නාමිකත්වය බොහෝ දුරට සීමා කර ඇත. කෙසේ වුව ද, සැක කටයුතු ගනුදෙනු වාර්තාකරණයේ පවතින දුර්වලතා, වාර්තා තබා ගැනීමේ ක්‍රමවේද සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ව ඇතැම් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්ගේ ඇති දැනුවත්භාවය විවිධ මට්ටම්වල පැවතීම අවදානම් සහිත ප්‍රධාන කරුණු ලෙස හඳුනාගෙන ඇත.

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම:**

ප්‍රධාන වශයෙන් රටේ සමස්ත ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම ඉහළ යෑම හේතුවෙන්, සියලු ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තින් පුරා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම පහළ මධ්‍යම මට්ටම දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇති අතර ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති පාලන ක්‍රමවේදයන්, පෙර ඇගැයීමට සාපේක්ෂ ව පුළුල් වශයෙන් නොවෙනස් ව පවතී. නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තින්ට ආවේණික වන අවදානමට ලක් වීමට ඇති හැකියාව සුළු වශයෙන් ඉහළ යෑම මේ සඳහා තවදුරටත් බලපා ඇත.

# ඇ.6. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම ඇගැයීම

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම**

ශ්‍රී ලංකාවේ, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ තර්ජන මට්ටම ඉහළ මධ්‍යම අගයක් දක්වා වැඩි වීම සහ අවදානමට ලක් වීමට ඇති හැකියාව මධ්‍යම මට්ටමක නොවෙනස් ව පැවතීම නිසා ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ සමස්ත අවදානම **ඉහළ මධ්‍යම** මට්ටමක පවතින බව තක්සේරු කර ඇත.

ඩයස්පෝරා අරමුදල්, ඩිජිටල් රැඩිකල්කරණය, කලාපීය වක්‍ර බලපෑම් සහ අවිධිමත් සහ නැගී එමින් පවතින මූල්‍ය ක්‍රමවේද භාවිතය මගින් පෝෂණය වන අන්තවාදී සහ බෙදුම්වාදී ජාලවලින් එල්ල වන තර්ජනවලට තවදුරටත් රට මුහුණ දෙමින් සිටියි.

ශක්තිමත් ව්‍යවස්ථාදායක රාමුවක් පවතින පසුබිමක නීතිය බලාත්මක කරන ආයතන ත්‍රස්තවාදයට අදාළ විමර්ශන සහ දේපළ රාජසන්තක කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ව කටයුතු කර ඇති අතර ඒ සම්බන්ධ නඩු පැවරීම් තවදුරටත් සීමිත මට්ටමක පවතී. ඇතැම් ක්ෂේත්‍රවල, විශේෂයෙන් විශාල මූල්‍ය ආයතන අතර මෙහෙයුම් සහ අධීක්ෂණ සම්බන්ධ වැඩිදියුණු කිරීම් දක්නට තිබුණ ද නීතිය බලාත්මක කිරීම, ආංශික අනුකූලතාව (විශේෂයෙන් නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සහ මධ්‍යම හා කුඩා මූල්‍ය ආයතන අතර), වත්කම් ප්‍රතිසාධනය සම්බන්ධ ප්‍රායෝගික අභියෝග තවදුරටත් පවතින අතර අවිධිමත් ප්‍රේෂණ පද්ධති මේ වනවිට නියාමනය කර තිබුණ ද ඒවායේ අධීක්ෂණ කටයුතු තවමත් ප්‍රාථමික අවධියක පවතී.

# ඇ.7. අනෙකුත් ප්‍රධාන අංශවල මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම්

## නෛතික පුද්ගලයින්

**මුදල් විශුද්ධිකරණ අවදානම – ඉහළ මධ්‍යම**

**ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම - මධ්‍යම**

සමාගම්, සමිති සහ පදනම්වල අවදානම් මෙහිදී සැලකිල්ලට ගෙන ඇති අතර, ඉන් 95%කට වැඩි පිරිසක් පෞද්ගලික ආයතන නියෝජනය කරයි. ප්‍රතිලාභී හිමිකාරීත්වය අනාවරණ කිරීම සම්බන්ධ විනිවිදභාවය අවම වීම ප්‍රධානතම අවදානම් සහගත අංශයක් ලෙස හඳුනාගෙන ඇත.

නෛතික පුද්ගලයින්ගේ ආයතනික අවදානම් ඇගැයීම

| ආයතනයේ ස්වාභාවය | මුදල් විශුද්ධිකරණ අවදානම | ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම |
|---|---|---|
| **පෞද්ගලික සමාගම්** | ඉහළ මධ්‍යම | මධ්‍යම |
| **පොදු සීමිත සමාගම්** | මධ්‍යම | පහළ මධ්‍යම |
| **සීමිත ඇපකර සමාගම්** | මධ්‍යම | මධ්‍යම |
| **විදේශීය/ විදේශ රටවල් සමග සබඳතා පවතින සමාගම්** | මධ්‍යම | පහළ මධ්‍යම |
| **අක්වෙරළ** | මධ්‍යම | පහළ මධ්‍යම |
| **සමාගම්** | මධ්‍යම | පහළ මධ්‍යම |
| **පදනම්** | ඉහළ මධ්‍යම | මධ්‍යම |
| **සමිති** | පහළ මධ්‍යම | පහළ මධ්‍යම |

## නෛතික වැඩපිළිවෙල

**මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම – මධ්‍යම**

ප්‍රකාශිත භාර සහ වක්ෆ් මණ්ඩලවල පවතින අවදානම් මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. කලාපයේ සෙසු රටවලට සාපේක්ෂ ව ශ්‍රී ලංකාව තුළ නෛතික වැඩපිළිවෙලවල භාවිතය සීමිත මට්ටමක පවතී. ඒවායේ සාපේක්ෂ ප්‍රමාණය, සංකීර්ණ ව්‍යුහයක් නොමැති වීම, විදේශයන් වෙත නිරාවරණ වීම සීමිත වීම සහ ප්‍රතිලාභී හිමිකාරීත්වය අනාවරණ කිරීමේ විනිවිදභාවය යනාදිය, නෛතික වැඩපිළිවෙලවල අවදානම් මට්ටම අවම වීම සඳහා හේතු වී ඇත.

## අතථ්‍ය වත්කම් සේවා සපයන්නන්

### මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම

පුද්ගලයන් අතර සෘජුව ගනුදෙනු කිරීමට ඉඩදෙන මාර්ගගත වේදිකා සහ භාරකාර නොවන පසුම්බි: මධ්‍යම

භාරකාර පසුම්බි සහ Fiat/අතථ්‍ය පරිවර්තන සේවාවන්: පහළ

ශ්‍රී ලංකාවේ අතථ්‍ය වත්කම් පද්ධතිය තවමත් ප්‍රාථමික මට්ටමක පවතින අතර මහජන උනන්දුව ඉහළ යෑම සහ අතථ්‍ය වත්කම්, සමපේක්ෂණ ආයෝජන සඳහා භාවිත කිරීම ඉහළ යෑම දක්නට ලැබුණ ද, අතථ්‍ය වත්කම් සහ අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වූ විස්තීර්ණ සහ නියාමන රාමුවක් මෙතෙක් ස්ථාපිත කර නොමැත. අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා විධිමත් ලියාපදිංචි කිරීමක්, බලපත්‍ර ලබා දීමක්, අධීක්ෂණයක් සහ බලාත්මක කළ හැකි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ වගකීම් නොමැති වීම නිසා මෙම අංශය, අවදානමට ලක්වීමට ඇති හැකියාව ඉතා ඉහළ වේ. කෙසේ වුව ද, නීතිය බලාත්මක කිරීමේ ආයතන අතථ්‍ය වත්කම් සම්බන්ධ විමර්ශන දිගටම සිදු කරන අතර අවශ්‍ය අවස්ථාවල දී විදේශීය වේදිකාවල පවතින අතථ්‍ය වත්කම් අත්හිටුවීමට පියවර ගනු ලබයි. එමෙන්ම, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන හෝ ශ්‍රී ලංකාවට සේවා සපයන විදේශීය අතථ්‍ය සේවා සපයන්නන් සමග ජාත්‍යන්තර වශයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයන් ද ක්‍රියාත්මක වේ.

## මූල්‍ය අන්තර්ග්‍රහණ නිෂ්පාදන/සේවා

### මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම

ක්ෂුද්‍ර ණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ණය, කණ්ඩායම් ණය, සාමාන්‍ය ඉතුරුම් සහ ස්ථාවර තැන්පතු, ක්ෂුද්‍ර රක්ෂණ, තැන්පතු මත ලබා දෙන ණය, උකස් තැබීම්: පහළ

වඩාත් ප්‍රචලිත නිෂ්පාදන/සේවාවල මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් පහළ මට්ටමක පවතින බව අවදානම් ඇගැයීම මගින් හඳුනාගෙන ඇති අතර, එම අංශවල මුදල් විශුද්ධිකරණ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම අනිසි ලෙස භාවිත කිරීමට ඇති ඉඩකඩ සීමිත කරමින්, ගනුදෙනු සීමා කිරීමට ගෙන ඇති පියවර සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදය මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ශක්තිමත් පාලන ක්‍රමවේද පැවතීම ඒ සඳහා හේතු වී ඇත. අඩු අවදානමක් සහිත නිෂ්පාදන බොහෝ විට පරිභෝජන කරනු ලබන්නේ අඩු ආදායම්ලාභී, ග්‍රාමීය, ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොලබන ජනතාව විසින් වන අතර, ඒවා සාමාන්‍යයෙන් නිවාස ඉදිකිරීම, කෘෂිකර්මාන්තය සහ ව්‍යවසායකත්වය වැනි විශේෂිත අරමුණු සඳහා භාවිත කරනු ලැබේ. මෙම නිෂ්පාදන මුහුණට මුහුණ සිදු කරන ගනුදෙනු හා සම්බන්ධ වන අතර, ඒවා මෙරට නේවාසිකයින්ට පමණක් සීමා වේ. එමෙන් ම, දේශීය නියාමන අධීක්ෂණය, අවදානම් ඇගැයීම්, පාරිභෝගික සත්‍යාපන ක්‍රියාපටිපාටි, කාර්යමණ්ඩල පුහුණුව සහ නිරන්තර විගණනවලට මෙම නිෂ්පාදන යටත් වන අතර එමගින් ඒවා අනිසි ලෙස භාවිත කිරීමේ හැකියාව අවම කෙරේ.

මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්, ප්‍රේෂණ සහ විදේශ විනිමය විකිණීම/මිලදී ගැනීම, කල්බදු මූල්‍යකරණ: මධ්‍යම

දේශාන්තර ගනුදෙනු, ඩිජිටල් භාවිතය සහ ඉහළ ගනුදෙනු සීමාවන් හේතුවෙන් මෙම නිෂ්පාදනවල අවදානම **මධ්‍යම මට්ටමේ** බවට තක්සේරු කර ඇත. ගනුදෙනු අධීක්ෂණය, පුහුණු සහ ගනුදෙනුකරුවන් පිළිබඳ ව නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති වැනි පාලන ක්‍රියාමාර්ග දැනටමත් ක්‍රියාත්මක වුව ද, නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා අවභාවිත වීම වැළැක්වීමේ අරමුණින් මෙම නිෂ්පාදන වර්ග අඛණ්ඩව නියාමනය කිරීම අවශ්‍ය වේ.

## ත්‍රස්තවාදයට මුදල් සැපයීම  සඳහා අවභාවිතා විය හැකි ලාභ නොලබන සංවිධාන කාණ්ඩයන්

දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටම් වල පවතින පහළ අවදානම් මට්ටමට සාපේක්ෂ ව ජාතික මට්ටමේ ලියාපදිංචි වී ඇති ලාභ නොලබන සංවිධානයන් ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අවභාවිතයට ලක්වීමේ මධ්‍යම අවදානමක් පවතින බව තක්සේරු කර ඇත. එම සංවිධාන විදේශිය ආධාර ලබාගැනීම/ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල කොටසක් ලෙස මෙහෙයුම් සිදු කිරීම/දිවයින පුරා විහිදුණු විවිධ භූගෝලීය කලාපයන්හි ක්‍රියාකාරකම් සිදු කිරීම/ඉහළ ආදායමක් පැවතීම සහ වාර්ෂික ව සිදු කරනු ලබන ඉහළ ව්‍යාපෘති සහ ප්‍රජා සේවා සංඛ්‍යාව මීට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**රූප සටහන 7: ජාතික මට්ටමේ ලාභ නොලබන සංවිධානවල හඳුනාගත් කාණ්ඩ 6 සම්බන්ධයෙන් ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා අවභාවිත වීම පිළිබඳ තක්සේරුගත අවදානම**



# ඇ.8. සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම් සාරාංශය

සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ ජාතික අවදානම් ඇගැයීම මගින් මූල්‍ය කාර්ය සාධක බලකායේ නිර්දේශ 1 සහ 7 යටතේ පවතින ඉලක්කගත මූල්‍ය සම්බාධක බැඳීම්වලට අදාළ අවදානම් විශ්ලේෂණය කරයි. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ 1718, 2231/1737 යෝජනා සහ ඊට අදාළ අනෙකුත් යෝජනා මගින් පනවා ඇති, සම්බාධක උල්ලංඝනය කිරීමේ, ක්‍රියාත්මක නොකිරීමේ සහ මගහැරීමේ සම්භාවිතාවය මෙහි දී ඇගැයීමට ලක් කෙරෙන අතර, සමූලඝාතක අවි සංගුණනයට මුදල් සපයන්නන් විසින් දේශීය පද්ධති, අංශ සහ ආයතන අවභාවිත කළ හැකි ආකාරය කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ.

කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන ජනරජය සහ ඉරාන ඉස්ලාමීය ජනරජය වසින් සම්බාධක මගහැරීම හේතුවෙන්, ගෝලීය සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම සහ සම්බාධක මගහැරීමේ තර්ජන සැලකිය යුතු ඉහළ මට්ටමක පවතින බව හඳුනාගෙන ඇත. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලය, මූල්‍ය කාර්ය සාධක බලකාය සහ අනෙකුත් අදාළ ගෝලීය ආයතන මගින් හඳුනාගෙන ඇති පරිදි, මෙම රාජ්‍යයන් විසින් නීති විරෝධී ක්‍රියාකාරකම් සැඟවීමේ අරමුණින් ක්‍රියාත්මක වන ආයතන, වෙළෙඳ කටයුතු සම්බන්ධ ලේඛන ව්‍යාජ ලෙස සැකසීම, සමුද්‍රීය කටයුතු භාවිතෙන් වංචා සිදු කිරීම සහ ඩිජිටල් වත්කම් භාවිත කිරීම වැනි නවීන ක්‍රමවේද භවිත කරයි.

ශ්‍රී ලංකාවේ සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම ආශ්‍රිත සිදුවීම් පවතින බවට නිශ්චිත ව හඳුනාගෙන නොමැත. කෙසේ වුව ද, මෙරට පවතින භූ ගෝලීය පිහිටීම, මූල්‍ය සම්බන්ධතා සහ සක්‍රීය වෙළෙඳ ප්‍රවාහ හේතුවෙන් මේ සඳහා අවභාවිත වීමේ සම්භාවිතාවක් පවතී. සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම මගින් රජයේ ආයතන, අධීක්ෂණ අධිකාරීන්, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් ඇතුළු ප්‍රධාන පාර්ශ්වකරුවන් ඇගැයීමට ලක්කර ඇත. මෙම ඇගැයීම සඳහා සන්දර්භීය විශ්ලේෂණ, ව්‍යුහගත ප්‍රශ්නාවලි, පාර්ශ්වකරුවන් සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා, දත්ත විශ්ලේෂණ සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ විශේෂඥ වාර්තා, මූල්‍ය කාර්ය සාධක බලකායේ ලේඛන සහ අනෙකුත් රටවල සිදුකර ඇති සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම් මගින් ලබාගත් විවිධ ක්‍රමවේද සහ සිද්ධි අධ්‍යයන උපයෝගී කර ගන්නා ලදී. පාර්ශ්වකරුවන්ගේ අවදානම් පහළ මධ්‍යම මට්ටමේ සිට ඉහළ මධ්‍යම මට්ටම දක්වා ශ්‍රේණිගත කර ඇත.

සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ සමස්ත අවදානම මධ්‍යම මට්ටමේ පවතින බව තක්සේරු කර ඇත. මෙම ශ්‍රේණිගත කිරීම මගින් ගෝලීය වශයෙන් පවතින සැලකිය යුතු තර්ජන සහ දේශීය වශයෙන් අවදානමට ලක්වීමට ඇති හැකියාව නිරූපණය වන අතර, මූල්‍ය ආයතන සහ අධීක්ෂණ අධිකාරීන් සතු සාපේක්ෂ වශයෙන් ශක්තිමත් අනුකූලතා රාමු මගින් එම අවදානම් අවම කරනු ලැබේ. දැනුවත්භාවය සම්බන්ධයෙන් පවතින දුර්වලතා සහ අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණයේ පවතින සීමා මගින් අඛණ්ඩ ව අවධානයෙන් පසුවීම සහ සක්‍රීය ව අවදානම් අවම කිරීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

මේ සඳහා ඔරොත්තු දීමට ජාතික වශයෙන් ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා, සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ඇගැයීම මගින් අංශ පුරා පවතින ප්‍රමුඛතා හඳුනාගෙන ඇති අතර, ඒ අතරට සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම පිළිබඳ දැනුවත්භාවය සහ පුහුණුව වැඩිදියුණු කිරීම, ප්‍රමිතිගත ස්වයංක්‍රීය සම්බාධක ආවරණය, ප්‍රතිලාභී හිමිකාරීත්වයේ විනිවිදභාවය ඉහළ නැංවීම, අන්තර්-නියෝජිතායතන සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සහ අධීක්ෂණ රාමු තුළට සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීමේ අවදානම් ක්‍රමානුකූල ව ඇතුළත් කිරීම මෙන් ම අදාළ පාර්ශ්වකරුවන් වෙන් වෙන් වශයෙන් ඉලක්ක කරමින් අවදානම් ලිහිල් කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම ද ඇතුළත් වේ.

# මූලික නිර්දේශ

**රූප සටහන 8: මූලික නිර්දේශ**

### 1
ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නීතිය, එහි පවතින දුර්වලතා නිරන්තරයෙන් විශ්ලේෂණය කිරීම හරහා, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ ජාත්‍යන්තර නිර්දේශවලට අඛණ්ඩව අනුකූල වීම

### 2
මුදල් විශුද්ධිකරණයේ මූලික වැරදි/නීති විරෝධි ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරමින්, මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම/සමූලඝාතක අවිසංගුණනයට මුදල් සැපයීම සම්බන්ධ විමර්ශන සහ නඩු පැවරීම්වල මෙන් ම වත්කම් රාජසන්තක කිරීම සඳහා වූ යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව ඉහළ නැංවීම.

### 3
ඉහළ අවදානම් සහිත අංශවල අධීක්ෂණ කටයුතු සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් කිරීම සහ අවදානම් ක්‍රමාංකනය ශක්තිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ අවදානම් පදනම් කරගත් අධීක්ෂණ රාමුව වැඩි දියුණු කිරීම.

### 4
සමස්ත දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම.

### 5
ඉහළ තර්ජන පවතින අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ආයතනික ව ස්ථාපිත වැඩසටහන් හරහා ආයතනික ධාරිතාව පුළුල් කිරීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම.

### 6
මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීම සම්බන්ධ යාවත්කාලීන කරන ලද සහ නිවැරදි දත්ත වෙත ප්‍රවේශ වීමේ හැකියාව තහවුරු කිරීම.

### 7
අවදානම්වලට අනුකූලව සකස් කරන ලද මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවේද හරහා ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය කිරීම.

### 8
අතථ්‍ය වත්කම් සේවා සපයන්නන් සඳහා වන විචක්ෂණශීලී නියාමන ආයතනයක් හඳුනා ගැනීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම/සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ බැඳීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම.

### 9
ජාතික සයිබර් ආරක්ෂණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම.

### 10
මූල්‍ය සමාගම් සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීයන්ගේ තත්කාලීන ගනුදෙනු අධීක්ෂණයට සහ අවදානම් ඇගැයීමට නවීන තාක්ෂණය අඛණ්ඩව භාවිත කිරීම.

### 11
සුරක්ෂිත ඩිජිටල් අනන්‍යතා පද්ධතියක් සහතික කිරීම සඳහා වන ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාව ලබාදීම.

### 12
සමූලඝාතක අවි සංගුණනයට මුදල් සැපයීම වැළැක්වීමේ අවදානම් ඇගැයීමේ සොයාගැනීම්වලට අනුකූල වන පරිදි පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

### 13
ඉහළ ගිය ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම්වල සොයාගැනීම්වලට අනුකූල වන පරිදි නෛතික රාමුව සහ ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

### 14
ඉහළ ගොස් ඇති, මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ තර්ජනවලට අනුකූල වන පරිදි ආයතනික ධාරිතාව පුළුල් කිරීම.

### 15
නෛතික පුද්ගලයන් සහ නෛතික වැඩපිළිවෙලවල ප්‍රතිලාභී හිමිකාරීත්වය සම්බන්ධ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.